# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2018 සැප්තැම්බර් මස 07 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2018.09.11 දින නිකුත් කරන ලදී)**


## ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතන (සංශෝධන)

**ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 33 දරන ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතන පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි**

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 34.00 තැපැල් ගාස්තුව : රු. 20.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 33 දරන ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි දීර්ඝ නාමයේ නීතිය බලපෑම වනුයේ තක්සේරුකරණ වෘත්තීයට අදාළව මහජන යහපත ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම මඟින් පනතේ විෂය පථය පුළුල් කිරීම වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ ආයතනයේ සාමාජිකයන් සංස්ථාගත වූ හා සංස්ථාගත නොවූ සාමාජිකයන් ලෙස වර්ගීකරණය කිරීම වේ.

***4 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියට අලුතින් 2අ වගන්තියක් ඇතුළත් කරනු ලබන අතර වගන්තියේ නීතිය බලපෑම වනුයේ 21 වන වගන්තිය මඟින් ඇතුළත් කරන ලද අ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරනු ලබන පරිදි ආයතනයේ සාමාජිකත්වය ශ්‍රේණිගත කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***5 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ තක්සේරුකරණ ප්‍රමිතීන් නිශ්චය කිරීම හා වෘත්තීය නිපුණත්වය ඇගයීම සම්බන්ධයෙන් ආයතනයේ බලතල පුළුල් කිරීම වේ.

***6 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය ඉවත්කර ප්‍රතියෝජනය කරනු ලබන අතර, ප්‍රතියෝජනය කරන ලද පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ අවශ්‍යකරන සුදුසුකම් සහ ඇතුළත්වීමේ ගාස්තු හා සාමාජික ගාස්තු ගෙවීම සම්බන්ධයෙන් අලුත් විධිවිධාන හඳුන්වා දීම වේ.

***7 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් 7අ, 7ආ, 7ඇ හා 7ඈ යන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර, අලුත් වගන්ති ඇතුළත් කිරීමේ නීතිය බලපෑම වනුයේ, පහත සඳහන් විධිවිධාන හඳුන්වා දීම වේ:-

(අ) සාමාජිකත්ව කාලසීමාව, සාමාජිකත්වය අලුත් කිරීම සහ අලුත් කිරීමේ ගාස්තුව;

(ආ) එක් එක් සාමාජිකත්ව වර්ගය සඳහා අදාළ වන ඉල්ලුම්පත්‍ර ගාස්තුව, ඇතුළත්වීමේ ගාස්තුව, සාමාජික ගාස්තුව හා අලුත් කිරීමේ ගාස්තුව අමාත්‍යවරයා විසින් නියෝග මඟින් නියම කරනු ලැබීම;

(ඇ) සභාවේ ගරු මහලේකම්වරයා විසින් සංස්ථාගත වූ හා සංස්ථාගත නොවූ සාමාජිකයින්ගේ රෙජිස්ටර පවත්වාගෙන යාම සඳහා; සහ

(ඈ) නියමිත පරිදි ස්වකීය අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය පිළිබඳව සභාව සෑහීමට පත්කිරීමට අපොහොසත් වන ආයතනයේ යම් සාමාජිකයකුගේ සාමාජිකත්වය අවසන් කිරීම පිළිබඳ සභාවට අවශ්‍ය පරිදි තීරණයක් ගැනීම සඳහා.

***8 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ පණ්ඩිතගණ, වෘත්තීය ආශ්‍රිත සහ අධිකාරලාභී ශ්‍රේණිවලින් තෝරාපත් කර ගත යුතු සාමාජිකයින් සංඛ්‍යාව නිශ්චිතව සඳහන් කිරීම මඟින් සභාවේ සංයුතිය වෙනස් කිරීම වේ.

***9 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ ධුරය හිස් කිරීමේ දී සැලකිල්ලට ගත යුතු හේතුවක් වශයෙන් "ඔහු තෝරා ගනු ලැබූ යම් ශ්‍රේණියක සාමාජිකයකුවීම අවසන්වීම" යන්න එකතු කිරීම සහ සභාවේ තෝරා ගත් සාමාජිකයකු විසින් සිය ධුරය හිස් කරනු ලබන අවස්ථාවක දී ඒ පුරප්පාඩු පුරවන ආකාරය ඇතුළත් කිරීම වේ.

***10 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ ගරු මහ ලේකම්, ගරු මහා භාණ්ඩාගාරික හෝ ගරු සහකාර මහ ලේකම් ධුර සඳහා තෝරා පත්වීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් ඉහළ නැංවීම වේ.

***11 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ පනතේ අන්තර්ගතයට එම විධිවිධාන ඇතුළත් කර ඇති බැවින් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි කාරණාවලට අදාළ ඇතැම් විධිවිධාන ඉවත් කිරීම වේ.

***12 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ ආයතනයේ යම් සැසිවාරයක ගණපූර්ණය සංශෝධනය කිරීම වේ.

***13 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ ආයතනයේ යම් සාකච්ඡා වාරයක ගණපූර්ණය සහ එකී සාකච්ඡා වාරයෙහි කටයුතු සඳහා ඇතුළත් විය යුතු කාරණා කවරේද යන්න නියම කිරීම වේ.

***14 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ ආයතනයේ විශේෂ මහා සභා රැස්වීමක් කැඳවනු ලැබිය හැකි අවස්ථා නිශ්චිතව දැක්වීම වේ.

***15 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ ආයතනයේ යම් සාමාන්‍ය රැස්වීමකට සහභාගීවීම සඳහා අවශ්‍ය බවට සභාව විසින් සලකනු ලැබිය හැකි වෙනත් තැනැත්තන්ට ආරාධනා කිරීම සඳහා සභාවට හැකිවන පරිදි විධිවිධාන සැලැස්වීම වේ.

***16 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ සභාව විසින් සභාවේ සාමාජිකයන් නාමලේඛනයෙන් ඉවත්කිරීම හෝ ඔවුන්ගේ සාමාජිකත්වය අත්හිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***17 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ ආයතනයේ සාමාජිකයන් විසින් පදවිනාම, නිලනාම සහ "තක්සේරුකරු" හෝ "වී.එල්.ආර්." යන පූර්ව නාම භාවිත කිරීම පිළිබඳ විධිවිධාන සංශෝධනය කිරීම වේ.

***18 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 17 වන වගන්තිය මඟින් කරන ලද සංශෝධනවලට ආනුෂංගික වේ.

***19 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියට 25අ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර අලුත් වගන්තියේ නීතිය බලපෑම වනුයේ චංචල දේපළක සහ අස්පර්ශනීය වත්කමක තක්සේරු කිරීමක් සිදු කරගෙන යාම සඳහා ආයතනයේ සංස්ථාගත වූ සාමාජිකයකුට අවසර ලබා දීම වේ.

***20 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් 32 වන වගන්තිය ඇතුළත් කරනු ලබන අතර මේ වගන්තියේ නීතිය බලපෑම වනුයේ "අමාත්‍යවරයා" සහ "පෙළඹවීම" යන යෙදුම් සඳහා අර්ථ නිරූපණ හඳුන්වාදීම වේ.

***21 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ අ උපලේඛනය ආදේශ කරනු ලබන අතර, අලුත් අ උපලේඛනයේ නීතිය බලපෑම වනුයේ ආයතනයේ සංස්ථාගත වූ හා සංස්ථාගත නොවූ සාමාජිකයන් ශ්‍රේණිගත කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***22 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ ආ උපලේඛනය ආදේශ කරනු ලබන අතර, අලුත් ආ උපලේඛනයේ නීතිය බලපෑම වනුයේ ආයතනයේ විවිධ සාමාජිකත්ව ශ්‍රේණි සඳහා සුදුසුකම් ලැබීම සඳහා වන උපමාන නිශ්චිතව දැක්වීම වේ.

***23 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියට ඇ සහ ඈ යන අලුත් උපලේඛන ඇතුළත් කරනු ලබන අතර, උපලේඛනයන්හි නීතිය බලපෑම වනුයේ පිළිවෙළින් ආයතනයේ සංස්ථාගත වූ හා සංස්ථාගත නොවූ සාමාජිකයන් වශයෙන් බඳවාගැනීම සඳහා ඉල්ලුම් කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය නිශ්චිත පරිදි දැක්වීම හා වෘත්තීය විෂමාචාරයක් සංයුක්ත කරනු ලබන්නා වූ ක්‍රියා හෝ නොකරහැරීම් නිශ්චිතව දැක්වීම වේ.

***24 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින්, 21 වන වගන්තිය මඟින් අ උපලේඛනයට කරන ලද සංශෝධනයන්ට ආනුෂංගික වන පරිදි ආයතනයේ සාමාජිකත්වයට අදාළ අන්තර්කාලීන විධිවිධාන සලස්වනු ලැබේ.

***25 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ සිදුකරන ලද වලංගු කාලසීමාව ඉකුත් වී නොමැති බඳවාගැනීම් හා ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ පවත්වා ගෙනයනු ලැබූ සාමාජිකත්ව රෙජිස්ටර, ප්‍රධාන ප්‍රඥප්තිය ක්‍රියාත්මකවීමෙන් පසුව ද ශේෂ කිරීම සඳහා විධිවිධාන සලස්වනු ලැබේ.

## ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතන (සංශෝධන)

එල්.ඩී.—ඕ. 50/2009

**ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 33 දරන ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතන පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2018 අංක  දරන ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 33 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 33 දරන ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතන පනතේ දීර්ඝ නාමය මෙයින් පරිච්ඡින්න කර ඒ වෙනුවට පහත දැක්වෙන දීර්ඝ නාමය මෙයින් ආදේශ කරනු ලැබේ:-

> "ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතනය යනුවෙන් හඳුන්වන ලබන ආයතනයක් පිහිටුවීම සඳහා ද, ආයතනයේ කටයුතු කළමනාකරණය පිළිබඳව සහ ආයතනයේ සාමාජිකයන්ගේ වෘත්තීය ප්‍රමිතීන් සහ විනය පවත්වා ගෙන යාම පිළිබඳව වගකිව යුතු ආයතනයේ සභාවක් පිහිටුවීම සඳහා ද, තක්සේරුකරුවන්ගේ වෘත්තියට අදාළව මහජන යහපත ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා ද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ;

> "(2) ආයතනයේ සාමාජිකයන් සංස්ථාගත වූ සහ සංස්ථාගත නොවූ සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතුය.".

ප්‍රධාන ප්‍රඥප්තියට 2අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 2අ වගන්තිය ලෙස බලාත්මක විය යුතුය:-

"සාමාජිකයන් ශ්‍රේණිගත කිරීම.

2අ. ආයතනයේ සාමාජිකයන් ශ්‍රේණිගත කිරීම මේ පනතේ අ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (ඔ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(ඔඔ) සංස්ථාව විසින් උචිත යයි සලකනු ලබන තක්සේරු ප්‍රමිති කලින් කල නිශ්චය කිරීම;

(ඔඔඔ) අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සඳහා වූ වෘත්තීය නිපුණත්වය ඇගැයීමේ ක්‍රමවේදයක් හෝ වෙනත් යම් අවශ්‍යතාවයක් හෝ නිශ්චය කිරීම;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"ආයතනයේ සාමාජිකත්වය සඳහා ඉල්ලුම් කිරීම.

7. (1) මේ පනතේ ආ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති සුදුසුකම් සහ පළපුරුද්ද සපුරාලනු ලබන යම් තැනැත්තකු විසින් මේ පනතේ ඇ උපලේඛනයේ සඳහන් ආකෘතියට අනුව සහ සඳහන් ආකාරයට ආයතනයේ සමාජිකත්වය සඳහා ඉල්ලුම් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිසි පරිදි ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති යම් තැනැත්තකු නියමිත ඇතුළත්වීමේ ගාස්තු සහ සාමාජික ගාස්තු ගෙවීමේ දී ආයතනයේ සාමාජිකයකු වශයෙන් නාම ලේඛනගත කරනු ලැබිය හැකි ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියට 7අ, 7ආ, 7ඇ සහ 7ඈ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒ වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියේ 7අ, 7ආ, 7ඇ සහ 7ඈ වගන්ති ලෙස බලාත්මක විය යුතුය :-

"සාමාජිකත්ව කාලසීමාව සහ නැවත අලුත් කිරීම.

7අ. (1) ආයතනයේ සාමාජිකත්ව කාලසීමාව දෙසැම්බර් මස තිස් එක් වන දිනයෙන් අවසන් වන වර්ෂයක කාලසීමාවක් විය යුතු අතර 22 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව වාර්ෂිකව අලුත් කරනු ලැබිය හැකි ය.

(2) සාමාජිකත්වය අලුත් කිරීමට අපේක්ෂා කරනු ලබන සෑම සාමාජිකයකු විසින් ම සාමාජිකත්වය අවසන්වීමට දින තිහකට අඩු නොවන කාලයක් තුළදී සාමාජිකත්වය අලුත් කිරීම සඳහා ඉල්ලුම් කරනු ලැබිය යුතු ය.

(3) නියමිත අලුත් කිරීමේ ගාස්තු ගෙවීම මත සාමාජිකත්වය අලුත් කරනු ලැබිය හැකි ය.

ඉල්ලුම් කිරීමේ ගාස්තු යනාදිය.

7ආ. අමාත්‍යවරයා විසින්, යම් වර්ගයක සාමාජිකත්වය සම්බන්ධයෙන් ගෙවිය යුතු ඉල්ලුම් කිරීමේ ගාස්තුව, ඇතුළත්වීමේ ගාස්තුව, සාමාජික ගාස්තුව සහ අලුත් කිරීමේ ගාස්තුව නියෝග මඟින් නියම කරනු ලැබිය හැකි ය.

රෙජිස්ටර.

7ඇ. (1) (අ) සංස්ථාගත වූ සාමාජිකයන් සහ සංස්ථාගත නොවූ සාමාජිකයන් වශයෙන් බඳවාගනු ලබන තැනැත්තන් වෙනුවෙන් රෙජිස්ටරයක් බැගින් තිබිය යුතු ය.

(ආ) එක් එක් රෙජිස්ටරය වෙනම කොටස්වලට බෙදනු ලැබිය යුතු අතර එම එක් එක් කොටස්, රෙජිස්ටරය අදාළ සාමාජික පන්තියේ විවිධ ශ්‍රේණි සම්බන්ධයෙන් විය යුතු අතර ඒ එක් එක් කොටසෙහි ඒ ශ්‍රේණියට බඳවා ගනු ලබන තැනැත්තන්ගේ නම්, ලිපින හා සුදුසුකම් අන්තර්ගත විය යුතු ය.

(2) සභාව සඳහා සහ එය වෙනුවෙන් සභාවේ ගරු මහ ලේකම්වරයා විසින් රෙජිස්ටර පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

සාමාජිකත්වය අවසන්වීම.

7ඈ. 5 වන වගන්තියේ (ඔඔ) ඡේදය යටතේ වූ යම් ඇගයීමේ ක්‍රමවේදයකට හෝ අවශ්‍යතාවයකට අනුකූලව ස්වකීය අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය පිළිබඳව සභාව සෑහීමකට පත් කිරීමට අපොහොසත් වන ආයතනයේ යම් සාමාජිකයකු, සභාව විසින් තීරණය කරනු ලබන යම් දිනයක සිට සාමාජිකයකු වීම අවසන් වන්නේ ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි (ආ) ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

“(ආ) පණ්ඩිතගණ ශ්‍රේණියෙන් තෝරාගනු ලබන සාමාජිකයන් පස් දෙනෙකු, වෘත්තීය ආශ්‍රිත ශ්‍රේණියෙන් තෝරාගනු ලබන සාමාජිකයන් සිව් දෙනකු සහ අධිකාරලාභී ශ්‍රේණියෙන් තෝරාගනු ලබන එක් සාමාජිකයකු;”;

(2) එහි (ඊ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

“(ඊ) සභාපති ධුරය අවසන් වරට දරන ලද තැනැත්තා.”; සහ

(3) එම වගන්තියේ අතුරු වගන්තිය ඉවත් කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (2) වන උපවගන්තියේ -

(අ) (ඉ) ඡේදයේ “අස්කරනු ලැබූ විට.” වචන වෙනුවට “අස්කරනු ලැබූ විට; නැතහොත්” යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (ඉ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(ඊ) ඒ සාමාජිකයා තෝරා ගනු ලැබූ යම් නිශ්චිත ශ්‍රේණියක සාමාජිකයකුවීම අවසන් වූ විට."; සහ

(ඇ) (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :-

"(3) මේ පනතේ වෙනත් යම් විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද එය නොසළකා මිය යෑම, ඉල්ලා අස්වීම හෝ අන්‍යාකාරයකින් සභාවේ යම් තෝරාගත් සාමාජිකයකු විසින් ස්වකීය ධුරය හිස් කරනු ලබන අවස්ථාවක දී, සභාව විසින් තත්කාර්ය සඳහා පවත්වනු ලබන රැස්වීමක දී, 8(2)(අ) සහ (ආ) සහ 11 වන වගන්තිවල විධිවිධාන සැළකිල්ලට ගනිමින්, ඒ පුරප්පාඩුව පිරවීම සඳහා සංස්ථාගත සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.";

(2) එහි (3) වන සහ (4) වන උපවගන්ති, එහි (4) සහ (5) වන උපවගන්ති ලෙස නැවත අංක කිරීමෙන්.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි (ආ) සහ (ඇ) ඡේද ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(ආ) ගරු මහ ලේකම්, ගරු මහා භාණ්ඩාගාරික හෝ ගරු සහකාර මහ ලේකම්, වෘත්තීය ආශ්‍රිත ශ්‍රේණියට වඩා පහත් නොවූ ශ්‍රේණියක නාම ලේඛනගත කර තිබීම;"; සහ

(2) එහි (ඈ) ඡේදය, (ඇ) ඡේදය ලෙස නැවත අක්ෂර යෙදීමෙන්.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි (ආ), (ඇ), (ඈ), (ඉ) හා (ඊ) ඡේද ඉවත් කිරීමෙන් ; සහ

(2) (උ) ඡේදයේ සිට (ඩ) ඡේදය දක්වා වූ ඡේද (ආ) ඡේදයේ සිට (ක) ඡේදය ලෙස නැවත අක්ෂර යෙදීමෙන්.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

''(2) ආයතනයේ යම් සැසිවාරයක ගණපූරණය, ඒ සැසිවාරයේ දී ඡන්දය දීමට සුදුසුකම් ලබන ආයතනයේ සංස්ථාගත වූ සාමාජිකයන්ගෙන් පහෙන් දෙකක් හෝ දෙසියයක් යන දෙකින් වඩා අඩු ප්‍රමාණය වේ.".

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි (4) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(4) ආයතනයේ යම් සාකච්ඡා වාරයක ගණපූරණය ආයතනයේ සංස්ථාගත වූ සාමාජිකයන් එකසිය පනහක් හෝ ඔවුන්ගෙන් හතරෙන් එකක් යන දෙකින් වඩා අඩු ප්‍රමාණය විය යුතු ය.'';

(2) එහි (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :-

"(5) වෙනත් කරුණාවලට අමතරව, සාකච්ඡා වාරයේ කටයුතු සඳහා පහත සඳහන් කාරණා ඇතුළත් විය යුතු ය; එනම්-

(අ) මධ්‍ය වාරයේ වාර්තාව කියවීම;

(ආ) මධ්‍ය වාරයේ වාර්තාව සම්මත කිරීම;

(ඇ) මධ්‍ය වාරයේ ගිණුම් ප්‍රකාශය සාකච්ඡාව සඳහා ඉදිරිපත් කිරීම;

(ඇ) මධ්‍ය වාරයේ ගිණුම් ප්‍රකාශය සම්මත කිරීම;

(ඉ) සභාව විසින් කරනු ලබන යෝජනා සම්මතයන්;

(ඊ) සභාවේ යෝජනා සම්මතයන් සම්මත කිරීම;

(උ) සභාව විසින් තීරණය කරනු ලබන ආකාරයට, තක්සේරු වෘත්තියේ නියැලීමට අදාළ යම් තාක්ෂණික කාරණයක් පිළිබඳව සලකා බැලීම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(1) සභාවේ සභාපතිවරයා විසින්, ස්වකීය කැමැත්ත පරිදි සංස්ථාගත වූ සාමාජිකයන්ගේ විශේෂ මහා සභා රැස්වීමක් කැඳවනු ලැබිය හැකිය; නැතහොත් සභාවේ සාමාජිකයන් පස්දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් විසින් හෝ ඡන්දය දීම සඳහා සුදුසුකම් සහිත ආයතනයේ සංස්ථාගත සාමාජිකයන් පනහකට නොඅඩු සංඛ්‍යාවක් විසින්, තත්කාර්ය සඳහා කරනු ලබන ලිඛිත ඉල්ලීමක් අනුව සංස්ථාගත සාමාජිකයන්ගේ විශේෂ මහා සභා රැස්වීමක් සභාවේ සභාපතිවරයා විසින් කැඳවනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියේ (4) වන උපවගන්තිය මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"(4) ආයතනයේ සාමාන්‍ය රැස්වීමක් සඳහා පැමිණෙන ලෙස සභාව විසින් යෝග්‍ය බවට සලකනු ලබන වෙනත් යම් තැනැත්තන්ට සභාව විසින් ආරාධනා කරනු ලැබිය හැකිය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි (4) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් :-

"(4) මේ වගන්තියේ (1) (ඇ) උපවගන්තිය යටතේ යම් පරීක්ෂණයකට යටත්ව සිටින සාමාජිකයකු විසින් ඉදිරිපත් කරනු ලබන කිසිදු ඉල්ලා අස්වීමක් සභාව විසින් භාර නොගත යුතු ය.

(5) මේ පනතේ කාර්ය සඳහා, මේ පනතේ ඇ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් වෘත්තීය විෂමාචාරයක් වන්නේ ය.";

(2) ඒ වගන්තියේ පැති සටහන ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන් :-

"සභාව විසින් සාමාජිකයන් නාමලේඛනයෙන් ඉවත් කිරීම හෝ ඔවුන්ගේ සාමාජිකත්වය අත්හිටුවීම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(1) ආයතනයේ පණ්ඩිතගණ සාමාජිකයකු වශයෙන් නාමලේඛනගත කරනු ලැබ ඇති ආයතනයේ සෑම සාමාජිකයකුට ම-

(අ) තමා පණ්ඩිතගණ සාමාජිකයකු බව පෙන්නුම් කිරීම සඳහා ස්වකීය නමට පසුව "එෆ්.අයි.වී." යන කෙටි නිල නාමය භාවිත කිරීම සඳහා අයිතිය තිබිය යුතුය;

(ආ) "වරලත් තක්සේරුකරු" යන පදවි නාමය භාවිත කිරීමට හිමිකම තිබිය යුතුය.";

(2) එහි (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

''(2) ආයතනයේ වෘත්තීය ආශ්‍රිත සාමාජිකයකු ලෙස නාමලේඛනගත කරනු ලැබ ඇති ආයතනයේ සෑම සාමාජිකයකුට ම තමා වෘත්තීය ආශ්‍රිත සාමාජිකයකු බව පෙන්නුම් කිරීම සඳහා ස්වකීය නමට පසුව "ඒ.අයි.වී." යන කෙටි නිල නාමය භාවිත කිරීම සඳහා අයිතිය තිබිය යුතුය.'';

(3) එහි (3) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්;

(4) එහි (4) සහ (5) වන උපවගන්ති, පිළිවෙලින් එහි (3) සහ (4) වන උපවගන්ති ලෙස නැවත අංක කිරීමෙන්;

(5) නැවත අංක කරන ලද (4) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(5) (1) සහ (2) වන උපවගන්ති යටතේ ලියාපදිංචි වී ඇති සෑම සාමාජිකයකුට ම ස්වකීය නමට පෙරාතුව "තක්සේරුකරු" යන පූර්ව නාමය භාවිතා කිරීම සඳහා සහ ඒ සඳහා "වී.එල්.ආර්." යන කෙටි නිල නාමය භාවිතා කිරීම සඳහා හිමිකම තිබිය යුතුය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියේ (1) උපවගන්තියේ (ආ) ඡේදය "23 වන වගන්තියේ (5) වන උපවගන්තිය" යන වචන සහ ඉලක්කම් වෙනුවට "23 වන වගන්තියේ (4) වන උපවගන්තිය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට 25අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 25අ වගන්තිය ලෙස බලාත්මක විය යුතුයඃ-

''චංචල දේපළ හා අස්පර්ෂණීය වත්කම් තක්සේරු කිරීම.

25අ. ආයතනයේ යම් සංස්ථාගත සාමාජිකයකු විසින් චංචල දේපළ හා අස්පර්ෂණීය වත්කම් පිළිබඳ තක්සේරු කිරීමක් සිදුකළ හැකි නමුත් ඒ තක්සේරුව කරගෙන යාම සඳහා ඒ තැනැත්තාට සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ විශේෂඥතාවක් තිබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට 32 වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 32 වන වගන්තිය ලෙස බලාත්මක විය යුතුය :-

"අර්ථ නිරූපණය.

**32.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වේ නම් මිස, මේ පනතේ -

""අමාත්‍යවරයා" යන්නෙන් මුදල් විෂයයභාර අමාත්‍යවරයා අදහස් වේ;

"පෙළඹවීම" යන්නට-

(අ) ගනුදෙනුකරුවන් පෙළඹවීම සඳහා යම් කොමිස් මුදල්, ගෙවීම් හෝ ප්‍රතිෂ්ඨා ගෙවීම් මඟින් යම් තැනැත්තකුගේ සේවය යම් ආකාරයට ලබා ගැනීමේ යෙදී සිටීම; හෝ

(ආ) තමා වෙනුවෙන් ගනුදෙනුකරුවන් අසාධාරණ ලෙස ආකර්ශනය කර ගැනීමේ කාර්යය සඳහා යම් ආකාරයකින් ප්‍රචාරණය කිරීම,

ඇතුළත් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ අ උපලේඛනය ප්‍රතියෝජනය කිරීම.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ අ උපලේඛනය මෙයින් ඉවත්කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ :-

**"අ උපලේඛනය** [2අ වන වගන්තිය]

ආයතනයේ සංස්ථාගත වූ සාමාජිකයන් සහ සංස්ථාගත නොවූ සාමාජිකයන් ශ්‍රේණිගත කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු යඃ-

(අ) ආයතනයේ සංස්ථාගත වූ සාමාජිකයකු, පණ්ඩිතගණ සාමාජිකයකු හෝ වෘත්තීය ආශ්‍රිත සාමාජිකයකු හෝ අධිකාරලාභී සාමාජිකයකු වශයෙන් ශ්‍රේණිගත කරනු ලැබිය යුතු ය; සහ

(ආ) ආයතනයේ සංස්ථාගත නොවූ සාමාජිකයකු, ආයතනයේ ගරු සාමාජිකයකු හෝ ශිෂ්‍ය සාමාජිකයකු හෝ පරිවාස සාමාජිකයකු වශයෙන් ශ්‍රේණිගත කරනු ලැබිය යුතු ය.".

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ ආ උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ "ආ" උපලේඛනය ප්‍රතියෝජනය කිරීම.

"ආ උපලේඛනය [7 වන වගන්තිය]

(1) යම් තැනැත්තෙකු පණ්ඩිතගණ සාමාජිකයකු ලෙස නාම ලේඛනගත කිරීම සඳහා යෝග්‍ය වන්නේ:-

(අ) ඔහු විසින් අවම වශයෙන් වෘත්තීය ආශ්‍රිත සාමාජික ශ්‍රේණියේ වසර පහළොවක් සේවය කරනු ලැබ ඇත්නම් හා 5 වන වගන්තිය යටතේ තීරණය කර ඇති අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සඳහා වූ වෘත්තීය නිපුණත්වය ඇගැයීමේ ක්‍රමවේදයක් හෝ වෙනත් යම් අවශ්‍යතාවයකට අනුකූලව තක්සේරු වෘත්තියේ යෙදී සිටින්නේ නම්:

එසේ වුව ද, දෙදහස් තුනේ පෙබරවාරි මස දහහතර වන දිනය වන විට සංස්ථාගත සාමාජිකයන් වූ සාමාජිකයන් ඉහත කී අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සඳහා වූ වෘත්තීය නිපුණත්වය ඇගයීම් ක්‍රමවේදයෙන් හෝ වෙනත් යම් අවශ්‍යතාවයෙන් නිදහස් විය යුතු ය; හෝ

(ආ) සභාවේ මතය අනුව, ඔහු පණ්ඩිතගණ සාමාජිකයකු ලෙස ඇතුළත් කර ගැනීමෙන් වෘත්තියේ අභිවෘද්ධිය ප්‍රවර්ධනය කිරීමට හේතු විය හැකි ආකාරයේ තක්සේරු කිරීම පිළිබඳ දැනුමක් හා වෘත්තීය විශිෂ්ටත්වයක් ඔහු ලබාගෙන ඇත්නම්,

වේ.

(2) යම් තැනැත්තකු වෘත්තීය ආශ්‍රිත සාමාජිකයකු වශයෙන් නාම ලේඛනගත කිරීම සඳහා යෝග්‍ය වන්නේ:-

(අ) ඔහු ආයතනයේ අවසන් විභාගය හෝ සෘජු අවසන් විභාගය හෝ ලන්ඩන් විශ්වවිද්‍යාලයේ, රීඩින් විශ්වවිද්‍යාලයේ හෝ සභාව විසින් පිළිගනු ලබන ශ්‍රී ලංකාවේ කවර හෝ විශ්වවිද්‍යාලයක දේපළ කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය හෝ කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ ඉඩම් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය හෝ රාජකීය වරලත් මැනුම්කරුවන්ගේ ආයතනයේ පොදු ව්‍යවහාර අංශයේ අවසන් විභාගය හෝ සමත් වී ඇත්නම් හෝ ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ තක්සේරුකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව ලබාගෙන ඇත්නම් හෝ ඉහත විභාගවලට සමාන වන බවට සභාව විසින් පිළිගනු ලැබ ඇති කවර හෝ අදාළ සුදුසුකමක් ලබාගෙන තිබේ නම්; සහ

(ආ) ඔහු, සුදුසුකම් ලැබීමෙන් පසු තක්සේරු වෘත්තියේ අවම වශයෙන් වසර දෙකකවත් පූර්ණ කාලීන පළපුරුද්ද තිබෙන සහ සභාව විසින් නියම කරනු ලැබ ඇති හා එයට පිළිගත හැකි පරිදි අධීක්ෂණයට භාජනය වී ඇති පරිවාස සාමාජිකයකු වන්නේ නම්; හෝ

(ඇ) ඔහු, සුදුසුකම් ලැබීමෙන් පසු තක්සේරු වෘත්තියේ පූර්ණ කාලීන වසර දෙකක පළපුරුද්දට සමාන වන සේ සලකනු ලබන අවම වසර සංඛ්‍යාවක් අර්ධ කාලීන පළපුරුද්දක් තිබෙන, සභාව විසින් නියම කරනු ලැබ ඇති හා එයට පිළිගත හැකි පරිදි අධීක්ෂණයට භාජනය වී ඇති සහ 5 වන වගන්තිය යටතේ තීරණය කර ඇති අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සඳහා වූ වෘත්තිය නිපුණත්වය ඇගැයීමේ ක්‍රමවේදයක් හෝ වෙනත් යම් අවශ්‍යතාවන්ට අනුකූලව තවදුරටත් වෘත්තියේ යෙදී සිටින්නේ නම්; හෝ

(ඈ) කවර හෝ විශ්වවිද්‍යාලයක සභාව විසින් පිළිගනු ලැබ ඇති පාඨමාලාවක් සඳහා තක්සේරු කිරීමේ විෂය ඉගැන්වීම පිළිබඳ අවම වශයෙන් සිව් වසරක පූර්ණ කාලීන අත්දැකීම් තිබීම,

වේ.

(3) යම් තැනැත්තකු අධිකාරලාභී සාමාජිකයකු ලෙස නාම ලේඛනගත කිරීම සඳහා යෝග්‍ය වන්නේ:-

(අ) වයස අවුරුදු 30 ට වැඩි තැනැත්තකු නම්; සහ

(ආ) ඔහු 1977 ජනවාරි 3 වන දිනට පෙරාතුව අවුරුදු හතකට අඩු නොවන කාලයක් තක්සේරුකරුවකු වශයෙන් වෘත්තියේ යෙදී ඇත්නම් සහ සභාව විසින් පිරිනමනු ලබන නිපුණතා සහතිකයක් ඇත්නම්,

වේ.

(4) යම් තැනැත්තකු පරිවාස සාමාජිකයකු ලෙස නාම ලේඛනගත කිරීම සඳහා යෝග්‍ය වන්නේ-

(අ) මෙහි උපලේඛනයේ (2) (අ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති පරිදි වෘත්තිය ආශ්‍රිත සාමාජික ශ්‍රේණියට ඇතුළත්වීම සඳහා පිළිගනු ලබන උපාධියක් හෝ ඩිප්ලෝමා පාඨමාලාවක් ඔහු විසින් සාර්ථකව සම්පූර්ණ කොට ඇත්නම්; සහ

(ආ) 5 වන වගන්තිය යටතේ නිශ්චය කරනු ලබන අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සඳහා වූ වෘත්තීය නිපුණත්වය ඇගැයීමේ ක්‍රමවේදයක් හෝ වෙනත් යම් අවශ්‍යතාවයකට අනුකූලව වෘත්තියේ යෙදී සිටින්නේ නම්,

වේ.

යම් තැනැත්තකුට පරිවාස සාමාජිකයකු ලෙස රැඳී සිටිය හැකි උපරිම කාලසීමාව වසර දහයක් විය යුතුය.

(5) යම් තැනැත්තකු ශිෂ්‍ය සාමාජිකයකු ලෙස නාම ලේඛනගත කිරීම සඳහා යෝග්‍ය වන්නේ –

(අ) ඔහුගේ වයස අවුරුදු දහ අටට වැඩි නම්; සහ

(ආ) ඔහු මෙහි උපලේඛනයේ 2(අ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති පරිදි වෘත්තීය ආශ්‍රිත සාමාජික ශ්‍රේණියට ඇතුළත්වීම සඳහා පිළිගනු ලබන සුදුසුකම්වලට අදාළ වන පරිදි සභාව විසින් පිළිගනු ලබන අධ්‍යාපන ආයතනයක අභ්‍යන්තර හෝ බාහිර, පූර්ණකාලීන හෝ අර්ධකාලීන, අවස්ථාවෝචිත පරිදි උපාධියක් හෝ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරන ශිෂ්‍යයකු ලෙස ලියාපදිංචි වී ඇත්නම්,

වේ.

යම් තැනැත්තකුට ශිෂ්‍ය සාමාජිකයකු ලෙස රැඳී සිටිය හැකි උපරිම කාලසීමාව වසර දහයක් විය යුතු ය.”.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ ආ උපලේඛනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපලේඛන එකතු කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලබන අතර, ඒ උපලේඛන ඒ ප්‍රඥප්තියේ ඇ සහ ඈ උපලේඛන ලෙස බලාත්මක විය යුතුය :- ප්‍රධාන ප්‍රඥප්තියට ඇ සහ ඈ අලුත් උපලේඛන එකතු කිරීම.

“ඇ උපලේඛනය [7 වන වගන්තිය]

(1) සංස්ථාගත වූ සාමාජිකයන්ගේ යම් ශ්‍රේණියක නාම ලේඛනගත කිරීම සඳහා ඇතුළත්වීම සඳහා වූ සෑම ඉල්ලීමක් ම :-

(අ) සභාවේ ගරු මහලේකම් වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය;

(ආ) සභාවේ ගරු මහලේකම් විසින් තත්කාර්යය සඳහා සපයනු ලබන ආකෘතියෙන් විය යුතු ය;

(ඇ) ඉල්ලුම්කරු ඒ ශ්‍රේණියේ නාම ලේඛනගත කරනු ලැබීම සඳහා යෝග්‍ය වනුයේ කවර සුදුසුකම් අනුව ද යන්න ප්‍රකාශ කෙරෙන්නක් විය යුතු අතර ඒ සුදුසුකම් දිවුරුම් ප්‍රකාශයකින් සනාථ කළ යුතු ය;

(ඈ) ඉල්ලුම්කරු විසින් අත්සන් කර තිබිය යුතු ය;

(ඉ) නිසි ඉල්ලුම්පත් ගාස්තුව, ඇතුළත්වීමේ ගාස්තුව හා සාමාජික ගාස්තුව සමග ඉදිරිපත් කළ යුතු ය; සහ

(ඊ) සභාවේ සාමාජිකයන් දෙදෙනකු විසින් හෝ ආයතනයේ සාමාජිකයන් සිව්දෙනකු විසින් නිර්දේශ කරනු ලැබිය යුතු අතර,

එම ආයතනයේ සාමාජිකයන්ගෙන් එක් අයකු පණ්ඩිතගණ සාමාජිකයකු විය යුතු සහ, එක් අයකු වෘත්තීය ආශ්‍රිත සාමාජිකයකු විය යුතු අතර දෙදෙනකුට අඩු නොවන සාමාජිකයන් ගණනක් අයදුම්කරු විසින් නාම ලේඛනගතවීමට අපේක්ෂා කරන ශ්‍රේණියේ නාම ලේඛනගත කරනු ලැබ ඇති සාමාජිකයන් විය යුතු ය.

(2) සංස්ථාගත නොවූ සාමාජිකයන්ගේ යම් ශ්‍රේණියක නාම ලේඛනගත කිරීම සඳහා වූ සෑම ඉල්ලීමක් මː-

(අ) සභාව විසින් තත්කාර්යය සඳහා සපයනු ලබන ආකෘතියෙන් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය;

(ආ) ඉල්ලුම්කරු ඒ ශ්‍රේණියේ නාම ලේඛනගත කරනු ලැබීම සඳහා යෝග්‍ය වනුයේ කවර සුදුසුකම් අනුව ද යන්න ප්‍රකාශ කෙරෙන්නක් විය යුතු අතර, ඉල්ලීම ගරු සාමාජිකයකු නොවන වෙනත් ඕනෑම ශ්‍රේණියකට ඇතුළත්වීම සඳහා වන ඉල්ලීමක් වන විට එම සුදුසුකම් දිවුරුම් ප්‍රකාශයකින් සනාථ කළ යුතු ය.

(ඇ) ඉල්ලුම්කරු විසින් අත්සන් කර තිබිය යුතු ය;

(ඈ) ඒ ඉල්ලීම ගරු සාමාජිකයකු නොවන වෙනත් ඕනෑම ශ්‍රේණියක නාම ලේඛනගතවීම සඳහා වන ඉල්ලීමක් වන විට ඒ ඉල්ලීම නිසි ඉල්ලුම්පත් ගාස්තුව, ඇතුළත්වීමේ ගාස්තුව හා සාමාජිකත්ව ගාස්තුව සමග ඉදිරිපත් කළ යුතු අතර, ඒ ඉල්ලීම ගරු සාමාජිකයකු ලෙස නාම ලේඛනගතවීම සඳහා වන විට නිසි සාමාජික ගාස්තුව සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය; සහ

(ඉ) යටත් පිරිසෙයින් සංස්ථාගත සාමාජිකයන් දෙදෙනකු විසින් නිර්දේශ කරනු ලැබිය යුතු ය.

ඈ උපලේඛනය [22 වන වගන්තිය]

පහත දැක්වෙන ක්‍රියා හෝ නොකර හැරීම් තක්සේරුකරුවකුගේ වෘත්තීය විෂමාචාර සංයුක්ත කරනු ලබයි; එනම්ː-

(අ) සාමාජිකයකු වශයෙන් ඔහුගේ තත්ත්වය අනිසි ලෙස භාවිත කිරීම;

(ආ) තක්සේරු වෘත්තීය හෝ ආයතනය අපකීර්තියට ලක්කිරීම හෝ අපකීර්තියට ලක්කිරීමට තැත් කිරීම;

(ඇ) තක්සේරු වෘත්තියට අහිතකර යම් ක්‍රියාවක යෙදීම හෝ ආයතනය අවමානයට ලක් කිරීම;

(ඈ) වෙනත් යම් සාමාජිකයකුගේ වෘත්තීය කීර්තිනාමය හෝ කුසලතාවය අවතක්සේරු කිරීම හෝ එසේ අවතක්සේරු කිරීමට තැත් කිරීම;

(ඉ) සේවාදායකයකුගේ හෝ අපේක්ෂිත සේවාදායකයකුගේ සම්බන්ධතා තක්සේරුකරුගේ සම්බන්ධතා හෝ ඔහුගේ ව්‍යාපාර සහායකුගේ සම්බන්ධතා සමඟ ගැටෙන අවස්ථාවක හෝ ගැටීමක් ඇති විය හැකි අවස්ථාවක සේවාදායකයකු වෙනුවෙන් ක්‍රියා කිරීමේ දී හෝ අපේක්ෂිත සේවාදායකයකු වෙනුවෙන් ක්‍රියා කිරීමට කල්පනා කිරීමේ දී සේවාදායකයා, අපේක්ෂිත සේවාදායකයා සහ ව්‍යාපාර සහායකයා වෙත වහාම අදාළ කරුණු හෙළි නොකිරීම සහ හෙළි කිරීම වාචිකව සිදු කරන විට ඉතා ඉක්මණින් එය ලිඛිතව සනාථ නොකිරීම සහ තමා වෙනුවෙන් ක්‍රියා නොකරන ලෙස සේවාදායකයා ඉල්ලා සිටින්නේ නම් මිස ක්‍රියා කිරීමට හෝ අඛණ්ඩව ක්‍රියා කිරීමට ඔහුට නොහැකි බව නොදැන්වීම;

(ඊ) ඔහු විසින් පුද්ගලිකව හෝ ඔහු හවුල්කරුවකු හෝ අධ්‍යක්ෂවරයකු වන තක්සේරුකරු වෘත්තියේ යෙදෙන ආයතනයක් හෝ සමාගමක් විසින්, සම්බන්ධතා අතර ගැටුම් පවතින පාර්ශ්ව දෙකකට හෝ වැඩි ගණනකට අදාළ කරුණු මෙම එක් එක් පාර්ශ්වයට වහාම හෙළි නොකරමින් මෙන්ම හෙළිදරව් කරන්නේ නම් ඒ හෙළිදරව් කිරීම ඉතා ඉක්මණින් අදාළ පාර්ශ්ව වෙත ලිඛිතව නොදන්වමින්, ඒ පාර්ශ්ව දෙක හෝ වැඩි ගණන සඳහා ක්‍රියා කිරීම;

(උ) යම් මතයක් ප්‍රකාශ කිරීම සාධාරණීකරණය කිරීම සඳහා ප්‍රමාණවත් තොරතුරු ලබා ගැනීමට අපොහොසත් වීම;

(ඌ) වෘත්තීය සේවා සඳහා ගාස්තු නියම කිරීම සඳහා ආරාධනාවක් ලැබීමෙන් තොරව හා අවශ්‍ය සේවාවල ස්වභාවය හා විෂය පථය තක්සේරු කිරීම සඳහා ප්‍රමාණවත් තොරතුරු සාමාජිකයා වෙත ලැබීමෙන් තොරව තරගකාරී ලෙස ගාස්තු නියම කිරීම;

(එ) වෘත්තීය සේවා සඳහා වරක් ගාස්තු නියම කිරීමෙන් අනතුරුව, එම සේවාව ම සඳහා වෙනත් සාමාජිකයකු විසින් නියම කරන ලද ගාස්තු සැළකිල්ලට ගෙන තම ගාස්තු සංශෝධන කිරීම;

(ඒ) වෘත්තීය සේවා සඳහා, වෙනත් සාමාජිකයකු විසින් ප්‍රකාශ කරනු ලබන හෝ අයකරනු ලබන ගාස්තුව සැළකිල්ලට ගනිමින් ගණනය කොට තම ගාස්තුව ප්‍රකාශ කිරීම,

(ඔ) ඔහු විසින් කවර හෝ ධුරයක් හෝ පදවියක් දැරීම නිසා ඔහු අපහසුතාවයකට පත්විය හැකි හෝ සාමාජිකයකු හා ඔහුගේ සේවාදායකයා අතර විශ්වාසය බිඳවැටී ඇති විට, යම් වෘත්තීය කටයුත්තක් භාර ගැනීම;

(ඕ) තම සේවාදායකයා වෙනුවෙන් කටයුතු කිරීම නතර කරන යම් සාමාජිකයකු විසින් එම නතර කිරීම පිළිබඳ අදාළ සේවාදායකයා වෙත සාධාරණ දැනුම්දීමක් නොකිරීම:

එසේ වුව ද, ඔහු, සේවාදායකයා විසින් ඒ සේවාදායකයා වෙනුවෙන් කටයුතු කිරීමෙන් වළකින ලෙස ඉල්ලා සිටිනු ලබන විට හෝ තම සේවාදායකයා සම්බන්ධයෙන් වූ ඕනෑම වෘත්තීය

කටයුත්තක් හෝ කාර්යයක් කිරීම සම්බන්ධයෙන් යම් සමාජිකයකු වෙත බලය නොපැවරෙන පරිදි සේවාදායකයා විසින් තවදුරටත් තොරතුරු ලබාදීමට අකමැති වන විට හෝ එසේ තොරතුරු ලබා දීම නොසලකා හරිනු ලබන විට සාමාජිකයා තම සේවාදායකයා වෙනුවෙන් ක්‍රියාකිරීමෙන් වැළකීම වෘත්තීය විෂමාචාරයක් නොවන්නේය;

(ක) යම් වෘත්තීය කටයුත්තක් ඉටු කිරීමේ දී ලබාගත් පුද්ගලික හෝ රහසිගත තොරතුරු එම කටයුත්ත ඔහු වෙත පවරනු ලැබූ තැනැත්තා, ඒ තැනැත්තාගේ නියෝජිතයා, යම් අධිකරණයක් හෝ මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ පත්කරනු ලැබූ යම් මණ්ඩලයක් හෝ බේරුම් කිරීමක් විසින් අවශ්‍ය බවට ඉල්ලා සිටියහොත් හැර හෙළිදරව් කිරීම:

එසේ වුව ද, එබඳු පුද්ගලික හෝ රහස්‍ය තොරතුරු හෙළි කිරීමෙන් වැළකීම සඳහා යම් සාමාජිකයකු සතු වගකීම සේවාදායකයා හා සාමාජිකයා අතර වෘත්තීය සම්බන්ධතාවය පවතින අතරතුර පමණක් නොව එකී සේවාදායකයා වෙනුවෙන් එකී සාමාජිකයා ක්‍රියාකිරීම නතර වූ පසු හා අදාළ සේවාදායකයාගේ මරණයෙන් පසු පවා අසීමිතව පවතින්නේ ය.

(ග) යම් සාමාජිකයකු තමා විසින් ම හෝ අනෙකකු මාර්ගයෙන්, ඍජුව හෝ වක්‍රව හෝ වැඩ ඉල්ලා පෙළඹවීම;

(ඝ) යම් සාමාජිකයකුගේ වෙළඳ දැන්වීමක, ලිපිද්‍රව්‍යවල, කාඩ්පතක හෝ නිවේදනයක පහත සඳහන් කිසිවක් ඇතුළත් වීම -

(අ) කරුණු පිළිබඳ සාවද්‍ය ප්‍රකාශයක්;

(ආ) ප්‍රකාශිත ලෙස උපදෙස් ඉල්ලා කරන පෙළඹවීමක්;

(ඇ) සාමාජිකයා විසින් ලබාදෙනු ලබන සේවා හා අනෙකුත් සාමාජිකයන් හෝ ආයතන විසින් ලබාදෙනු ලබන සේවා පිළිබඳ වූ ප්‍රකාශිත සංසන්දනයක්;

(ඈ) යම් සාමාජිකයකු හෝ ඔහුගේ ආයතනය විසින් තක්සේරු වෘත්තියේ යම් විශේෂ අංශයක "විශේෂඥතාවය" හෝ "ප්‍රවීණතාවය'' ලබා ඇති බවට කරනු ලබන කියාපෑමක්;

(ඡ) යම් සාමාජිකයකු විසින් ආයතනයේ ලියාපදිංචි කරනු ලැබූ ඔහුගේ නම හෝ තනතුර හැර වෙනත් නමකින් හෝ තනතුරකින්, ආයතනය විසින් ඒ වෙනත් නම හෝ තනතුර පිළිගනු ලැබ ඇත්නම් මිස, තක්සේරු වාර්තා නිකුත් කිරීම හා තක්සේරු කිරීමට අදාළ කාරණාවල දී උපදෙස් දීම වැනි යම් වෘත්තීය කටයුතු වල දී තමා ආයතනයේ ලියාපදිංචි වී ඇති නමට හෝ තනතුරට වඩා වෙනස් නමකින් හෝ තනතුරකින් පෙනී සිටීම;

(ට) ස්වකීය වෘත්තීය කටයුතුවලදී බරපතල නොසැළකිල්ලක් පෙන්වීම;

(ඞ) දැන දැනම, නොසැළකිලිමත් ලෙස හෝ වංචාසහගත ලෙස සේවාදායකයකුට තක්සේරුවක් පිළිබඳව වැරදි මතයක් පළකිරීම හෝ වැරදි තක්සේරුවක් ඉදිරිපත් කිරීම;

(ණ) සභාවට පිළිගත හැකි හේතුවක් නොමැතිව 5 වන වගන්තිය යටතේ තීරණය කරනු ලබන යම් තක්සේරු ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රියා කිරීමෙන් බැහැරවීම හෝ අනුකූලව ක්‍රියා කිරීමට අපොහොසත් වීම;

(ත) ආයතනය විසින් සාමාජිකයන් වෙත නිකුත් කර ඇති සාමාජික නිල මුද්‍රාව හෝ වෙනත් ආකාරයක අනන්‍යතාවක් අනවසරයෙන් වෙනස් කිරීම.”.

අන්තර්කාලීන විධිවිධාන.

**24.** (1) මේ පනත ආරම්භ වන දිනයේ දී උපාධිධාරී සාමාජික සහ ආශ්‍රිත සාමාජිකය ශ්‍රේණිවලට අයත් සියලු තැනැත්තන්, මේ පනත ආරම්භ වන දින සිට සහ ඉන් පසුව වෘත්තීය ආශ්‍රිත ශ්‍රේණියට ඇතුළත්කර නාමලේඛනගත කර ඇති ලෙස සලකනු ලැබිය යුතු යː

එසේ වුව ද, වෘත්තීය ආශ්‍රිත සාමාජික ශ්‍රේණියේ සාමාජිකත්ව කාලසීමාව ගණනය කිරීමේ කාර්යය සඳහා, උපාධිධාරි ශ්‍රේණියේ සම්පූර්ණ සාමාජිකත්ව කාලසීමාව ද, ආශ්‍රිත ශ්‍රේණියේ සාමාජිකත්ව කාලසීමාවෙන් තුනෙන් දෙකක් ද ගණනය කරනු ලැබිය යුතුය.

(2) (අ) මේ පනත ආරම්භවීමට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරන ලද ආයතනයේ සභාව මේ පනත මඟින් සංශෝධිත 8 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අලුත් සභාවක් තෝරාගනු ලබන තෙක් අඛණ්ඩව ධුර දැරිය යුතු ය.

(ආ) මේ පනත ආරම්භ වී මාස හයක කාල සීමාවක් ඇතුළත තත්කාර්යය සඳහා කැඳවනු ලබන ආයතනයේ සංස්ථාගත සාමාජිකයන්ගේ විශේෂ මහා සභා රැස්වීමක දී අලුත් සභාව තෝරාගනු ලැබිය යුතු ය.

(ඇ) මේ පනත ආරම්භවීමට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරන ලද ආයතනයේ සභාව විසින්, ඉහත කී මාස හයේ කාලසීමාව තුළ ආයතනයේ යම් සැසිවාරයක් පැවැත්වීමට නියම කර තිබුණ ද, ඒ සැසිවාරය එසේ නියම කරනු ලැබූ ආකාරයට පවත්වනු නොලැබිය යුතු ය.

(ඈ) (2) වන උපවගන්තිය යටතේ පවත්වන ලද විශේෂ මහා සභා රැස්වීම 18 වන වගන්තියේ කාර්යය සඳහා ආයතනයේ සැසිවාරයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

**25.** (1) මේ පනත ආරම්භ වන දිනයේ දී හෝ ඊට පෙර ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ කරනු ලැබූ යම් නාම ලේඛනගත කිරීමක වලංගුභාවය මේ පනත ආරම්භ වන දිනයේ දී ඉකුත් නොවී පවතින්නේ නම් ඒ නාම ලේඛනගත කිරීම සියලු කාර්යය සඳහා 7 වන වගන්තිය යටතේ කරනු ලැබූ නාම ලේඛනගත කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය. ශේෂ කිරීම්.

(2) මේ පනත ආරම්භවන දිනයේ දී හෝ එදිනට පෙර ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ පවත්වාගෙන යනු ලැබූ යම් රෙජිස්ටරයක් මේ පනත මගින් ඇතුළත් කර ඇති පරිදි වූ 7ඇ වගන්තිය යටතේ පවත්වාගෙන යනු ලැබ ඇති රෙජිස්ටරයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

**26.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.